# සන්ධි

සන්ධි යනු පූර්ව හා අපර වර්ණයන් හෙවත් අක්ෂර නිසි පරිදි ගැළපීමයි. ඒ අනුව සන්ධි කාර්යයන් 3කි. එනම්,

* ලෝපය (අකුරක් ඉවත් කිරීම)
* ආදේශය (අකුරක් වෙනුවට වෙනත් අකුරක් පැමිණවීම)
* ආගම (අළුතෙන් ම අකුරක් පැමිණවීම)

සිදත් සඟරාවට අනුව සන්ධි ක්‍රම 10කි. ඒවා නම්,

01 පූර්වස්වර ලෝප සන්ධිය
02 පරස්වර ලෝප සන්ධිය
03 ස්වර සන්ධිය
04 ස්වරාදේශ සන්ධිය
05 ගාත්‍රාදේශ සන්ධිය
06 පූර්වරූප සන්ධිය
07 පරරූප සන්ධිය
08 ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
09 ආගම සන්ධිය
10 ද්විත්වරූප සන්ධිය

1. පහත සඳහන් පද විසන්ධි කරන්න.

i. ගුරුතුමා
ii. වියවුල්
iii. මලසුන
iv. වටොර
v. ළිංවතුර
vi. ගිණියම්
vii. ඇද්දළ
viii. අත්‍යාවශ්‍ය
ix. තප්පර
x. දඬුවම්

2. පහත සඳහන් පද සන්ධි කරන්න.

i. කොස් + ඉන්න
ii. ළිප් + ගල

iii. තඹර + රෝර
iv. සං + උපකාර
v. දුක් + පත්

3. එක් එක් සන්ධි ක්රමයට අදාළව වචන 10 බැගින් වචන 100ක එකතුවක් සාදන්න.